// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2027/40 - 2017 ජූලි මස 14 වැනි සිකුරාදා - 2017.07.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

2016 වසරේ අංක 10 දරන උතුරු පළාත් සෞඛ්‍ය සේවා (සංශෝධන) ප්‍රඥප්තිය

**2015 වසරේ අංක 01 දරන උතුරු පළාත් සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තිය.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාත් සභාව විසින් පහත සඳහන් පරිදි නීති පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය උතුරු පළාතේ 2016 වසරේ අංක 10 දරන සෞඛ්‍ය සේවා (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර උතුරු පළාතේ ගරු ආණ්ඩුකාරවරයාගේ එකඟතාවය ලැබුණු දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය. — *ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය*

02. 2015 වසරේ අංක 01 දරන උතුරු පළාත් සෞඛ්‍ය සේවා ප්‍රඥප්තියේ 08 වැනි වගන්තිය ඉවත් කර පහත සඳහන් නව උපවගන්තිය ඇතුළත් කිරීම මඟින් සංශෝධනය කරනු ලැබේ. — *මුල් ප්‍රඥප්තියේ 8 වැනි වගන්තිය සංශෝධනය කිරීම.*

> " පළාත් අධ්‍යක්ෂක, මහජන සෞඛ්‍ය සම්බන්ධ කටයුතු පිළිබඳ මෙම ප්‍රඥප්ති පනත් න්‍යායන්හි යුතුකම් හා සේවාවන් ක්‍රියාත්මක කිරීමේදීත්, ඉටු කිරීමේදීත්, අවබෝධ කර ගැනීමේදීත් එම කරුණු සම්බන්ධව කටයුතු කරන පළාත් පාලන අධිකාරියේ අධ්‍යක්ෂක/කොමසාරිස්/ලේකම් ඇතුලු අයගේ උපදෙස් මත කටයුතු කළ යුතු අතර පළාත් පාලන අධිකාරියේ අධ්‍යක්ෂක/කොමසාරිස්/ලේකම් ඇතුලු පිරිස පළාත් අධ්‍යක්ෂක තුමාට අවශ්‍ය තොරතුරු ලබාදී සහාය දැක්විය යුතුයි"

03. මෙම ප්‍රඥප්තියේ දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි භාෂා අතර යම් අසංස්ථිතියක් පවතින විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය. — *යම් අසංස්ථිතියක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්වෙන බව.*

07-981/1



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උතුරු පළාතේ පළාත් සභාව

### 2016 වසරේ අංක 10 දරන උතුරු පළාත් සෞඛ්‍ය සේවා (සංශෝධන) ප්‍රඥප්තිය

උතුරු පළාත්, පළාත් සභාව විසින් 2016 වර්ෂයේ ජනවාරි මස 12 වෙනි දින සම්මත කරන ලද 2016 වර්ෂයේ අංක 10 දරන උතුරු පළාත් සෞඛ්‍ය සේවා (සංශෝධිත) ප්‍රඥප්තිය සඳහා උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2017 වර්ෂයේ ජූලි මස 11 වෙනි දින අනුමැතිය ලබා දී තිබෙන බව මෙමඟින් දැනුවත් කරනු ලැබේ.

කේ. තෙයිවේන්ත්‍රිම්,
ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
උතුරු පළාත් සභාව.

2017 ජූලි මස 12 වැනි දින,
සභා ලේකම් කාර්යාලය,
ඒ 9 මාර්ගය,
කයිතඩි.

07-981/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.